රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 17/96

මගේ අංකය :-III/163/1/එල්/එල්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.06.20 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන්

ආයතන සංග්‍රහයේ XXVIII වන පරිච්ඡේදයේ 1:1 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවන අතර, රජයේ සේවාවන්හි නියුතු කනිෂ්ඨ සේවකයන් හැර අනෙකුත් සියළුම සේවකයන්ගේ කාර්යාල වේලවා (දිවා භෝජනය සඳහා විනාඩි 30 ක කාලය සමඟ ) 1996.06.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙ.ව. 9.00 සිට පස්වරු 4.45 දක්වා විය යුතු බව රජය විසින් තීරණය කර තිබේ. මුදල් ගනුදෙනු කටයුතු සඳහා රජයේ සියළුම කාර්යාල වැඩ කරන දිනයන්හි පස්වරු 3.30 දක්වා ඉඩකඩ සහ පහසුකම් සැලසිය යුතුය.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 162 හි සඳහන් පරිදි කනිෂ්ඨ සේවකයන් එනම්, කාර්යාල කාර්ය සහායකයින්, බයිසිකල් පණිවුඩකරුවන්, කාර්යාල කම්කරුවන් සහ සමාන්තර සේවාවන්වල සේවකයින් සඳහා (විනාඩි 30 ක දිවා භෝජන කාලවේලාවක් සමඟ ) කාර්යාල වේලාව පෙ.ව. 8.30 සිට ප.ව. 5.15 දක්වා වේ.

03. ප්‍රමාද වී පැමිණෙන නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 3/92 සහ 6/94 මගින් ලබාදුන් සහනයන් ඉහත දක්වන ලද නව කාර්යාල වේලාවන්ට අනුරූපව සංශෝධනය වන බව සැලකිය යුතුය.

අ.කලෝ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.